**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව 2021/2022**
**අවසාන පරීක්ෂණය-තෙවන මට්ටම**
**LLU3703/LWU1411-ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක්**

---

දිනය:19.01.2023 කාලය:පෙව 9.30 සිට පව 12.30 දක්වා

---

**ප්‍රශ්න සංඛ්‍යාව 08**

**ප්‍රශ්න 05 ට පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.**

**01.** අධිකරණමය අර්ථ නිරූපණයන් හරහා සහ ව්‍යවස්ථාදායකය හඳුන්වා දෙන ලද වෙනස්කම් නිසා ආරම්භයේදී ප්‍රාදේශීය නීතියක්ව පැවති උඩරට නීතිය පසුව පුද්ගල නීතියක් බවට පත් විය.

අධිකරණමය අර්ථ නිරූපණයන් සහ ව්‍යවස්ථාපිත නීති කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් උඩරට නීතිය ප්‍රාදේශීය නීතියක සිට පුද්ගල නීතියක් දක්වා වෙනස් වූ ආකාරය පිළිබඳ සවිස්තරාත්මක සටහනක් ලියන්න.

**(ලකුණු 20)**

**02.** සුමන්තිරන් යාපනයේ ද්‍රවිඩ දෙමාපියන්ට දාව 1975 දී උපත ලැබීය. ඔහුගේ ප්‍රාථමික අධ්‍යාපනය යාපනය හින්දු විද්‍යාලයෙන් ලැබූ සුමන්තිරන් ද්විතීයික අධ්‍යාපනය සඳහා මහනුවර ත්‍රිත්ව විද්‍යාලයට ඇතුළත් වූයේය. පාසල් අධ්‍යාපනය සාර්ථකව අවසන් කිරීමෙන් පසු සුමන්තිරන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව පළමු පන්ති සාමාර්ථයක් සහිතව නීතිවේදී උපාධිය ලබා ගත්තේය. අනතුරුව ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුවට කථිකාචාර්යවරයකු වශයෙන් සේවයට බැඳුණේය. වසර 2003 දී එම විශ්ව විද්‍යාලයේම සේවය කළ ශෂිකලා සමඟ සුමන්තිරන් විවාහ වූයේය. ශෂිකලා යාපනයේ ද්‍රවිඩ දෙමාපියන්ට දාව උපත ලබා යාපනයේ හැදී වැඩුන තැනැත්තියක් වූවාය. විවාහයෙන් අනතුරුව සුමන්තිරන් සහ ශෂිකලා කෑගල්ලේ කුලියට ගත් නිවසක වාසය කළහ. ඔවුන්ගේ එකම දියණිය ජානයා ඔවුන් කෑගල්ලේ සිටියදී උපත ලැබීය. 2012 දී ශෂිකලා ඇයගේ අසනීපයෙන් පසු වූ මව රැක බලා ගැනීම සඳහා සේවයෙන් ඉල්ලා අස් වී ජානයා සමඟ යාපනයට ගියාය. සුමන්තිරන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අඛණ්ඩව සේවය කළ අතර කෑගල්ලේ නිවසේ ජීවත් විය.ඔහු සෑම මසකම ශෂිකලා සහ ඔහුගේ පවුල බැලීමට යාපනයට ගියේය. 2017 දී ශෂිකලාගේ මව මරණයට පත් විය. 2018 දී සුමන්තිරන් කෑගල්ලේ නව නිවසක් ඉදි කළ අතර ශෂිකලාට සහ ජානයාට තමා සමඟ නැවතී සිටීමට ආපසු පැමිණෙන ලෙස පැවසීය. තවද ඔහු පුද්ගලික අමතර පන්ති ආරම්භ කිරීම සඳහා කුලියට ලබා දීමේ අරමුණින් පේරාදෙණියේ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදි කළේය. 2021 දී සුමන්තිරන් යාපනය බලා ගමන් ගනිමින් සිටියදී හදිසි අනතුරකට ලක් වීමෙන් මරණයට පත් විය.

සුමන්තිරන් පාලනය වන්නේ තේසවලමේ නීතියෙන් ද සාමාන්‍ය නීතියෙන් ද යන්න දැන ගැනීමට ශෂිකලා ඔබගෙන් උපදෙස් බලාපොරොත්තු වේ.

අදාල නඩු තීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන දක්වමින් ශෂිකලාට උපදෙස් ලබා දෙන්න.

**(ලකුණු 20)**

**3.** 'රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ පොදු නීතිය වශයෙන් විස්තර කරනු ලබන්නේ එය පුද්ගලික නීතිවල පවතින හිස්තැන් පිරවීමට ඒකාකාරීව අදාල කළ හැකි ව්‍යස්ථාපිත නොවන නෛතික මූලධර්ම පදනමක් සපයන හෙයිනි. රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ බොහෝ නීති ක්ෂේත්‍රයන්හි අඛණ්ඩව අදාල වේ.'

රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ අඛණ්ඩව අදාල වන්නා වූ නීති ක්ෂේත්‍රයන් හඳුනා ගන්න. ශ්‍රී ලංකාවේ අධිකරණ රෝම ලන්දේසි නීති මූලධර්ම හඳුනා ගැනීම සහ අදාල කිරීම සම්බන්ධව දක්වන ප්‍රවේශය සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

**4.**පහත සඳහන් සිද්ධීන් සාකච්ඡා කරන්න. නඩු තීරණ සහ අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන දක්වමින් පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(අ) සිංහල කාන්තාවක වන සමාධි සමඟ විවාහව සිටියදී ඒකපාර්ශවීයව ඉස්ලාම් ආගම වැළඳ ගත් අයේෂ්, මුස්ලිම් කාන්තාවක වන සාහියා සමඟ විවාහ විය.

(ආ) මුස්ලිම් පුද්ගලයකු වූ අබ්දුල්, මුස්ලිම් කාන්තාවක වූ ෆාතිමා සමඟ විවාහය පවතිද්දී රෝමානු කතෝලික ආගම වැළඳගෙන රෝමානු කතෝලික කාන්තාවක වූ ක්‍රිස්ටිනා සමඟ විවාහ විය.

(ඇ) වයස අවුරුදු10ක මුස්ලිම් පිරිමි ළමයෙකු වූ රිස්වාන්ට ඔහුගේ මාමා වෙතින් ත්‍යාගයක් ලැබුණ අතර රිස්වාන්ගේ මව වන ෆෙඩ්රූසා ත්‍යාගය පිළිගනු ලැබිණ.

(ඈ) ජමීල් වයස අවුරුදු 16ක මුස්ලිම් පාසල් දරුවෙකි. ඔහුගේ පියා වන මජීඩ් ජමීල්ව නඩත්තු කිරීම ප්‍රතික්ෂේප කරයි.

**(එක් කොටසකට ලකුණු 5)**

**(5×4= ලකුණු 20)**

**5.** 'යටත් විජිත පාලකයන්ගෙන් උරුම වූ ප්‍රධාන නීති ක්‍රම දෙකකින් සහ පෞද්ගලික නීති තුනකින් ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය සමන්විත වේ. එමනිසා එක සමාන අධිකරණ බල ප්‍රදේශයක වෙනස් වූ නීති මූලධර්ම සහ සංකල්ප අදාල කිරීමේදී නීති අතර ගැටුම් ඇති විය හැක.'

ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය තුළ පවතින බහුවාදය පිළිබඳ ගැටලු සඳහා අවශ්‍ය උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය අගයන්න.

**(ලකුණු 20)**

**6.** ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය සහ යුක්තිය පසිඳලීමේ ක්‍රමයට 1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ නීතිය මගින් හඳුන්වා දෙන ලද වෙනස්කම් පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.

1973 අංක 44 දරණ යුක්තිය පසිඳලීමේ නීතිය මගින් පවතින අධිකරණ ක්‍රමයට සිදු කළ බලපෑම ඔබගේ වාර්තාව තුළ සැකෙවින් ඇගයීම අවශ්‍ය වේ.

**(ලකුණු 20)**

**7.** "මෙකී සියලු හේතූන් මත මා නිගමනය කරනු ලබන්නේ, 1799 සැප්තැම්බර් 23 ප්‍රකාශනය අනුව නිශ්චිතව හඳුනා ගන්නා ලද අධිකාරීන් විසින් තීරණය කරනු ලබන අපගමනයන් සහ වෙනස් කිරීම්වලට යටත්ව රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ පොදු නීතිය වන බවය. එනමුත්, එකී බලාධිකාරීන් යන්නට අධිකරණ ඇතුළත් නොවේ."

C.G Weeramantry J in *De Costa Vs Bank of Ceylon* (1969) 72 NLR 457 at p513

ඉහත ප්‍රකාශය ඇසුරින් ව්‍යස්ථා මගින් ඉංග්‍රීසි නීතිය පිළිගැනීම සාකච්ඡා කරන්න. අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු මගින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

**(ලකුණු 20)**

**8.** පහත සඳහන් **ඕනෑම මාතෘකා දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) පූර්ව යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීම

(ආ) ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිය

(ඇ) ලන්දේසි යුගයේ ලන්දේසි නීතිය සහ රෝම ලන්දේසි නීතිය පිළිගැනීම

(ඈ) අධිකරණ තීරණ හරහා ඉංග්‍රීසි නීතිය පිළිගැනීම

**(එක් කොටසකට ලකුණු 10)**

**(10×2-ලකුණු 20)**

-සියලුම හිමිකම් ඇවිරිණි-